**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ**

**සිංහල I**

**13 ශ්‍රේණිය**

**අවසාන වාර පරීක්ෂණය - 2023**

**පිළිතුරු පත්‍රය**

(1). (අ)

i. තමා ම රත්රන් අරගෙන අකුරු ලියන ආකාරය නොදන්නා කෙනෙක් පුස්කොළ පත්වල කටුගානා පරිද්දෙන්
ii. පියාණන් විසින් තැනවූ එම කරාඹුව කැටයම්වලින් තොරව මට සිළුටු වූ බැවිනි.
iii. බමුණා අමතා ඔබගේ පුතාගේ ස්වරූපය සුබ නොවේ
iv. කැටයමින් යුතු නොවන

(ආ)

i. එම සිටුතුමා තරුණ කාලයෙහි කරනම් ගැසීම වැනි ක්‍රීඩාවන් කරන අවස්ථාවක බඩවැල උඩට පැමිණ මැදින් එය ගැට ගැසී ගියේ ය.
ii. එකල්හි සිටුතුමා වියළි ගිය දරකෝටුවක් සේ වියළී දවසින් දවස කෙට්ටු වී කහපැහැ වී ගියේ ය.
iii. තෙලක් ගැල් වූ අවස්ථාවක මෙන් මුළු ශරීරයෙහි ම නහර මතු වී පෙනේනට විය.
iv. දිරවීමක් - ආහාර දිරවීමක් සිදු නොවේ.

(ඉ)

i. ගින්නේර මල්වැනි ඇස් ඇති මනා වූ ස්ත්‍රීන්ගේ සරාගී හැඟීම් දනවන විලාසයෙන් යුතු චන්ද්‍රිකාවනි, ඔබ ශෝක නොකරන්න. ඉතින් නුඹ කැමති නම් මට භාර්යාව කරගෙන දහසය දහසක් අන්තඃපුරයට නුඹ එක්ව රාජ කුලයෙහි ප්‍රසිද්ධියට පත්වන්න.
ii. අවලක්ෂණ තෝ මා නිසා කිසිම අපරාධයක් කර හැකි. මාගේ සැමියා මැරුවා නොවේද? ඔහු කෙරේ සෙනෙහසින් අඬා මිය ගියත් මා ඔබට බිරිඳ නොවෙමි. යනුවෙන්
iii. බියසුලු ස්වභාවය සහිතව ජීවත්වන්නට කැමති නම් තලිස් පත්‍ර නම් ඖෂධ විශේෂය ගල්වා තුවරලා ආහාරය කොට වාසය කරන්නාවූ.
iv. බොහෝ සේ දෝෂාරෝපණය කොට , දොස් කියා

(ඊ)

i. තම පියාගෙන්
ii. තමා පොරවාගෙන සිටි සාටකය මදක් පහත් කොට ශරීරයේ රශ්මි මාලා විහිද වුවාය.
iii. ඉතා සුන්දර සුමුදු පැහැයෙන් , වෙනස් ම පැහැ ඇති ඉතා රතු තොල්පෙති දෙක පුබුදුවා.
iv. කුන්ද මල් පොහොට්ටු

(උ)

i. යුද්ධයේ දී කඩුව ලෙළදෙන විට සතුරු හදවත් ද බියට පත්වීම සතුරන්ගේ භාර්යාවන්ගේ හදවත ද ලැජ්ජාවට පත් කිරීම
ii. ''යුදෙහි ඔහු කග ලිය ''
''ළත'ඹු සිතුවිලි ලිය ....''
iii. යුද්ධයේ දී ඔහු කඩුව ලෙළ දෙන ආකාරයට ඔහුගේ සතුරන් බියට පත් විය.
iv. රුපු + අඹු එනම් සතුරන්ගේ බිරිඳෑවරුන්

(ඌ)

i. දඹදෙණිය රාජධානි සමයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී කතා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. සොහොනෙහි අඬමින් සිටි මට්ටකුණ්ඩලීගේ පියාට එහි පැමිණි දේවතාවා විසින් දරුවා මළ ශෝකයෙන් නොහඬන ලෙස උපදෙස් දුන් අවස්ථාවේ , පෙර හැඳුනුම්කමක් නැතිව ම තමාට පිහිට වූ නිසා අදින්න පුබ්බක තෙපි කවුරුදැයි විමසූ අවස්ථාවේ තමා ඒ ඔබගේ මියගිය පුතණුවන් බව දේවතාව පැවසූ අවස්ථාවේ අදින්න පුබ්බක විසින දේවතාවාට මෙසේ කියන ලදී.
ii. දඹදෙණි රාජධානි සමයේ මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත ජීවක වෛද්‍යවරයාගේ කතා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. ජීවක කුමරු විසින් සාකේත නුවර සිටු දේවියගේ ශීර්ෂාබාධය සුව කිරීමට ගිය අවස්ථාවේ සේවකයන්ගෙන් ඔහු බාල දරු කෙනෙකුන් බව දැන සිටු දේවිය විසින් ජීවක කුමරුට බඩගිනි නම් බත් ඉල්වාගෙන කා වෙතත් උවමනාවක් ඇත්නම් එය ද ඉල්වාගෙන විකාර නොදොඩා ආපසු යන්ට කියා සේවකයන් අත කියා එවූ විට ජීවක කුමරු විසින් සේවකයන්ට මෙසේ කියන ලදී.

iii. කුරුණෑගල රාජධානි සමයේ රචිත ජාතක පොතෙහි එන චුල්ල ධනුද්ධර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. තම ස්වාමියා සොරා ලවා මරවා සොරා සමග ගඟ සමීපයට පැමිණි අවස්ථාවේ සොරා විසින් ස්ත්‍රියගේ අභරණ ද ගෙන ඈ ගඟ බඩ සමීපයෙහි දමා ගිය අවස්ථාවේ ශක්‍රදෙව් පංචශිඛ හා මාතලී දෙව් පුතුන් විසින් ඇයට පාඩමක් කියා දිය යුතුයි කියා සිතා පංචශිඛ උකුසු වෙසක් ද , මාතලී දෙව්පුත් මත්ස්‍ය වෙසක් හා ශක්‍ර තෙමේ කැණහිල් වෙසක් ගෙන ගඟ සමීපයට පැමිණි මාතලී ගඟ දිගේ මත්ස්‍යයෙකුව පෙනි යද්දී එය ඩැහැ ගැනීමට තම කටේ තිබූ මස් කැටිය බිම දමා මත්ස්‍යා අල්වා ගැනීමට දියට බට විට උකුස්සා විසින් මස් කැටිය ඩැහැ ගත්තේ ය. කටේ තිබූ මස් කැටියත් දියේ සිටි මාළුවත් අහිමි වූ නරියා ගඟ බඩ සිටි ස්ත්‍රියගේ මුහුණ බලමින් සිටින විට, එම ස්ත්‍රිය විසින් ඉහත ප්‍රකාශය නරියා හට (ශක්‍රයාට) ප්‍රකාශ කරන ලදී.

iv. ගම්පළ රාජධානි සමයෙහි II වන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයෙන් උපුටා ගන්නා ලද්දකි. සේවිකාව විසින් නන්දිවාණිජගේ බිරිඳට රජුගේ සිව නම් අමාත්‍යයා විසින් බඳු පඬුරු පිණිස මාවටුගම සැරිසරන විට වෙළඳ භාර්යාව දැක උමතු වී ඇගේ සැමියා වන නන්දිය වෙළෙන්දා වෙළදාම පිණිස ගොස් ඇති බව දැන ඇය තමා වසගයට ගැනීමට උත්සහා කරන අවස්ථාවේ ශිව අමාත්‍යයා විසින් නන්දිවාණිජගේ භාර්යාවට ප්‍රකාශ කරන ලද්දකි.

v. ලෙනාඩ් වුල්ෆ් විසින් රචනා කරන ලද Village in the Jungle කෘතිය ඒ.පී. ගුණරත්නයන් විසින් බැද්දේගම නමින් අනුවර්තනය කරන ලදුව එම කෘතියෙන් උපුටා ගන්නා ලද්දකි. ප්‍රනාන්දු මුදලාලි විසින් බබුන් බොරු චෝදනාවකට සිරගත කොට ඔහුගේ බිරිඳ වූ පුංචි මැණිකාට අයුතු යෝජනාවක් කරන අවස්ථාවේ පුංචි මැණිකා විසින් ප්‍රනාන්දු මුදලාලිට ප්‍රකාශ කරන ලද්දකි.

vi. එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචනා කරන ලද ''පෙමතෝ ජායති සොකො '' නාට්‍යයෙන් උපුටා ගන්නා ලද්දකි. ස්වර්ණතිලකා සරණපාවා ගත් උද්දාල බමුණා සාරමසක් ම සිප් හලට නොයා සිටින විට උද්දාල අමතා අධික ලෙස විඳින ප්‍රීති ප්‍රමෝදය සැණෙකින් අතුරුදන් වේ දැයි අසන ස්වර්ණතිලකා විසින් අසන අවස්ථාවේ ඊට පිළිතුරු දෙන උද්දාල බමුණා විසින් මෙසේ ප්‍රකාශ කරන ලදී.

vii. රංජිත් ධර්මකීර්ති මහතා විසින් රචිත කවියෙකුට අත්දැකීමක් නමැති කෙටි කතාවෙන් උපුටා ගන්නා ලද්දකි. කුණු මාළු පාර්සලයක් අතින් ගෙන බීමතින් සිටි මඟියා බස් එකෙන් ඇද දමන ලෙස සෙසු මගීන් කෑගසන විට රියදුරා බසයේ තිරිංග තදකොට කරදර නොකර අනික් බස් එකේ එන ලෙස කී විට බීමත් මඟියා විසින් රියදුරාට මෙලෙස කියන ලදී.

(එ)

- ❖ 70 දශකය නියෝජනය කරන මොනිකා රුවන් පතිරණ කිවිඳිය විසින් නිර්මාණය කරන ලද පද්‍ය පන්තියකි.
- ❖ කුටුම්භයේ බර අඩු කිරීමට දරුවන් ළමා මෙහෙකාර සේවයේ යෙදවීම හා බැඳුණු පොඩි දුව පද්‍ය පන්තිය මෙහෙකාර සේවයේ යෙදෙනා කුඩා දැරියකගේ සිත නැගෙන සිතුවිලි විෂය වස්තුව කරගනිමින් රචිතය
- ❖ මෙම පද්‍ය පන්තිය සාර්ථක වීමට කාව්‍ය අන්තර්ගතය මෙම දැරියගේ ජීවිතය හා ඓන්ද්‍රීයව බද්ධ වී ඇති ආකාරයෙන් පැහැදිලි වේ.
- ❖ පවුලේ බර අඩු කරන්න ගෙදරින් පිටවන්නට පෙර
  මතකද අම්මේ නුඹ මට ඇමතුවේ පොඩූ දුවේ කියලා
- ❖ පොඩි දරුවෙකු අතින් අරන් පාසලකට මං යනකොට
  දකින කෙනෙක් මට කිව්වේ බේබිගෙ ආයම්මා කියලා පන්ති පරතය - බේබි හා ආයම්මා
- ❖ ඒත් අම්මේ දවස ගෙවිලා නිදි පැදුරේ ඇළවුනාම
  තවමත් සිහිනෙන් නුඹ මට කියන්නේ පොඩි දුවේ කියලා
  ආධ්‍යාත්මික බැඳීම විශ්වසනීයත්වයෙන් ඉදිරිපත් කරයි. භාෂාව ද අන්තර්ගතය වඩා ධ්වනිපූර්ණ කිරීමට හේතු වී ඇත. ''මතකද අම්මේ උඹ මට ....... ඇමතුවේ පොඩි දුවේ කියලා ....... '' ''උඹ මට'' ගැමි භාෂා ව්‍යවහාරය ''පොඩි දුව'' ගැමි ගෙදර බාල දියණිය '' මට කිව්වේ ලිසී කියලා - පොඩි දුව'' ලිසී නැමති මෙහෙකාරිය බවට පත්වීමේ ඛේදවාචකය. බේබිගේ ආයම්මා වීම ....... සංක්ෂිප්තාව තුළ සමාජ පන්ති දෙකක නියෝජනය ඉදිරිපත් කරන කුස්සි අම්මා ....... සමස්ත පද්‍ය පන්තියම ගැමි භාෂා ව්‍යවහාරයෙන් පෝෂණය වී ඇත.

(2). සිංහල ගද්‍ය සාහිත්‍ය ඉතිහාසය සම්බන්ධයෙන් දඹදෙණි යුගයේ වැදගත්කම

- ❖ පොළොන්නරු රාජධානියෙන් පසුව දඹදෙණි රාජධානි සමයේ බිහි වූ සාහිත්‍යය දඹදෙණි සාහිත්‍යය යි.
- ❖ ධර්මසේන හිමි, බුද්ධ පුත්‍ර හිමි , අනෝමදස්සි හිමි , කලිකාල සාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු රජු ආදිහු එම සාහිත්‍ය යුගය බැබළ වූ වියත්හු වෙති.
- ❖ මෙකල ලියවුණු පද්‍ය ග්‍රන්ථ හතරකි.
  කව් සිළුමිණ , එළු සඳැස් ලකුණ , ලකුණු සර , සිදත් සඟරාව
- ❖ ඇතැම් වියතුන්ට අනුව ගද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය මෙය යි.
- ❖ පන්සය පනස් ජාතක පොතට පමණක් දෙවන වන ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලිය හා දෙවන පැරකුම්බාවන්ගේ විශුද්ධි මාර්ග සන්නය මේ යුගයේ ලියැවිණි.

- ❖ දහම්හොත් මෙන්ම ලෞකික විෂයයන් සම්බන්ධව ද පොත් ලියැවිණි.
- ❖ සද්ධර්මරත්නාවලිය හා පූජාවලිය බණකතා පොත් විය.
- ❖ කර්ම විභාගය අඥාත කර්තෘ කෘතියන් වූ ධර්ම විවරණ ග්‍රන්ථයකි.
- ❖ වැඩි වශයෙන් සන්න ග්‍රන්ථ ලියවුණු යුගයකි.
- ❖ විශුද්ධි මාර්ග සන්නය , අටදාසන්නය , ධම්මපද පුරාණ සන්නය, විරිත් සන්නය ඉන් කීපයකි.
- ❖ සිංහල සාහිත්‍යයේ පළමු කෝෂ ග්‍රන්ථය වන පියුම්මලා මේ යුගයේ රචිතය
- ❖ බුද්ධ පුත්‍ර හිමි විසින් ගද්‍යයයෙන් රචිත , යෝගා වර්ණය හා ප්‍රයෝග රත්නාවලිය මේ යුගයට අයත් වෛද්‍ය ග්‍රන්ථයකි.

**මනුෂ්‍ය සිතුම් පැතුම් හා චරිත ස්වාභාවයන්හි හැසිරීම් රටාව පිළිබඳ ධර්මසේන හිමි සතුව පැවති විඥාණය -**

- ❖ සසර සැරිසරන්නා වූ ස්ත්‍රී පුරුෂයන් රාග ද්වේෂ මෝහාදියෙන් පරිපීඩිතව නානා ගති ස්වභාවය දරන්නේය. ඔවුන් දෙස සානුකම්පිතව හා උපේක්ෂාවෙන් බැලීම බුදුන් වදාළ දහම ය.
  නිදසුන් - මට්ටකුණ්ඩලී කතා වස්තුව අදින්න පුබ්බක චරිතය - දැඩි මසුරු බව
- ❖ බුදුන්ගෙන් බණ අසා නිවන් දැක මසුරු සිත් තුනී වනතෙක් තණ අග ගලා තෙල් බින්දුවක් විතරත් අනුන්ට නුදුන් විරුය
- ❖ පුතුට කුණ්ඩලාභරණ සාදා දෙන ආකාරය '' අකුරු ලියන සේ නොදන්න කෙනෙකුන් පත්වල හිරි අඳිනා සේ'' තමාම කුණ්ඩලාභරණ සැදීමෙන් ඔහුගේ මසුරු බව විෂද වෙයි.
- ❖ මට්ටකුණ්ඩලී මිය ගිය පසු ගෙයින් පිටත තබනුයේ පැමිණෙන වුන් ඔහුගේ වස්තු ලෝභය පිළිබඳ දැනගනීවී යන බියෙනි.
- ❖ මට්ටකුණ්ඩලී සොහොනට ගොස් මළ පුතු දමා සොහොනෙහි හිඳ ඇඬීම
- ❖ මට්ටකුණ්ඩලී දෙව් පුත් තම පියාගේ ව්‍යාජ දරු සෙනෙහස දැක ඔහු වෙහෙසට පත් කරන්නට සිතීම.
  ''පියා කෙරෙහි අමනාපයෙන් මට්ටකුණ්ඩලී වේශයෙන් අවුත් සොහොන් පිටියට නුදුරු තැනක සිට හඬයි''
- ❖ මිය ගිය පුතු ඉල්ලන රථ මැදිරියට අවැසි රෝද දෙක තනවා දෙන්නට අදින්න පුබ්බක සිතීම (පෙර තිබූ ලෝභය අත් හැරීම)

**මට්ටකුණ්ඩලී පුතුගේ චරිතය හැසිරෙන ආකාරය -**

- ❖ පියාගේ අධික මසුරුකම සරදමට ලක් කිරීම හා ඔහුගේ ධනයේ ශූන්‍යත්වය ඔහුට පසක් කරදෙන ආකාරය ''මාගේ රථ මැදිරිය ගනරන්මුවා ය. එසේ හෙයින් ඊට තරම් වතොත් හිර හා සඳය......''
- ❖ අදින්න පුබ්බක තම මළ පුතුගේ පුවත හාස්‍යයට ලක් කිරීම විවිධ උපමා අසුරෙන් (නොපැතුව මනා දෙය පතයි) යන්න ආදි තවත් පිළිගත හැකි නිදසුන් නිවැරදි පිළිතුරු ලෙස භාරගන්න.
  කුණ්ඩලකේශී කතා වස්තුව

**කුණ්ඩලකේශි චරිතය -**

- ❖ යෞවන මදයෙන් මත් හෙයින් පුරුෂයන් කෙරෙහි ලොල්කම් ඇත්තෝය'' යෞවනයේ ප්‍රේමාශක්ත බව
- ❖ මරන්ට ගෙන යන සොරෙකු දැක ඔහුම පතා සිටු කුමරි චරිතය හැසිරෙන ආකාරය ''මරන්ට ගෙන යන තැනැත්තා වූ දැක ඔහු කෙරෙහි පිළිබඳ සිත් ඇති ව ඔහුම පතා බතුත් නොකා යානට හැඟිලා වැදහොත්තේ ය.
- ❖ සොරා සරණ කර දුන් පසු ඔහු වෙනුවෙන් ම වෙහෙසෙන තරුණ දියණියකගේ සැලමුතු ස්නේහයේ මහිමය ''තරුණ සිටු දුවණියෝ එවක් පටන් ඔහු සිත් ගන්ට සිව්හරණලා සැරහීගෙන තුමූ ම ඕ හට බත් මාළු පිසති. කවති , පොවති ඉස සෝධවති......''

**ජීවිතයේ අනපේක්ෂිත මරණය හමුවේ ඇය ක්‍රියාත්මක වන ආකාරය -**

- ❖ ''මාත් ආභරණත් නුඹ සන්තක වුව මරන්නෙ හැයි ද?'' ජීවිතය ඉල්ලා සිටින ආකාරය
- ❖ ''ආභරණත් හැරගත මැනව, මා අතිනුත් මෙහෙ හැර ගත මැනමැනවැයි කිවු ය.''
- ❖ අනපේක්ෂිත අභියෝග හමුවේ ඊට මුහුණදීමට තරම් ඇය ශක්තිමත් වන ආකාරය '' ..... දැන් මරති කියා මුසුප්පු වන්ට පිළිවන් ද? බල එකෙක් නම් මියයන ගමනේ මා සිතත් මහත් සේ වැදගත දුන මැනව.....''
- ❖ තමා මරණයට පත් කිරීමට පැමිණෙන සතුරා මරා දැමීමට තීරණය කර ක්‍රියාත්මක වන ආකාරය -
  'ස්වාමීනි , මේ කෙළවර දැක්මය. මෙවක් පටන් මුඹ වහන්සේගේ මා දැක්මකුත් මා මුඹවහන්සේගේ දැක්මකුත් නැතැයි කියලා ඉදිරි දිසාවේ සිටත් සිපගෙන පියා කුමක්දෝ හෝයි සිතමින් ගල් කෙළවර පමා ව සිටියහු තුමූ පිටිපස්වලා එක් අතෙකින් බොටුව අල්වාගෙන එක් අතෙකින් පිටිමුල අල්වාගෙන උඹගේ කාය බල තරමට තමන්ගේ ඥානකෘති වූ මයා බලය මහත් හෙයින් ගල් මුදුනෙන් දැමූහ ......''

❖ ලෞකික ජීවිතය අසාර්ථක වූ කල්හි ඈ ලෝකෝත්තර වශයෙන් ජීවිතය ජය ගැනීමට උත්සහ කරන ආකාරය (තවත් අදාළ නිදසුන් නිවැරදි පිළිතුරු ලෙස භාර ගන්න.)

**නැතහොත්**

**කුරුණෑගල යුගයේ වැදගත්කම (සාහිත්‍ය ඉතිහාසය සම්බන්ධයෙන් -**

❖ දඹදෙණි සාහිත්‍ය අවධියෙන් පසු කුරුණෑගල සාහිත්‍ය අවධිය ඇරඹේ.
❖ ග්‍රන්ථකරණයෙහි නියැළුණු පඬිවරුන් හා විල්ගම්මුල හිමි දෙව්රදදම් පසගිනා , වීරසිංහ ප්‍රතිරාජ, සකල විද්‍යා චක්‍රවර්තී පරාක්‍රම පණ්ඩිත යන වියත් හු මෙකල විසුහ.
❖ සිංහල සාහිත්‍ය සතු විශාලතම ගද්‍ය ග්‍රන්ථ පන්සිය පනස් ජාතක පොත් මෙම යුගයෙහි රචිතය.
❖ බහුකතෘක කෘතියක් වූ මෙය වීරසිංහ ප්‍රතිරාජ අමාත්‍යවරයාගේ ආරාධනයෙන් ලියැවිණි.
❖ දෙව්රද දම්පසගිනාවන් විසින් දළදා සිරිත ද මෙකල ලියැවිණි.
❖ එය වෘත්තගන්ධී ශෛලියෙන් ලියැවී ඇත. (එනම් විරිතක සුවඳ ඇති......) නමුත් ගද්‍යයෙන් රචනා වී ඇත.
❖ උම්මග්ග ජාතිකයත් ජාතක කතා සංග්‍රහ (බණ කතා පොත්) මෙකළ ලියැවිණි.
❖ විල්ගම්මුල හිමියන්ගේ සිංහල බෝධි වංශය , අනාගත වංසයත් මෙකල ලියැවිණි.
❖ සකල විද්‍යාචක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිතයන්ගේ කෘතියක් වූ සිංහල ථූප වංශයත් පූජනීය වස්තුව වල / සිරිත් විරිත්වල තොරතුරු එක් කොට ලියන ලද ඉතිහාස ග්‍රන්ථයන් ය.
❖ මයූර නම් කවියෙකු විසින් සූර්ය ශතකයට සන්නයක් මෙකල ලියා ඇත.
❖ මේ අනුව කුරුණෑගල යුගය ගද්‍ය සාහිත්‍ය බණ කතා පොත්වලින් ද ඉතිහාස ග්‍රන්ථවලින් ද සන්න ග්‍රන්ථයකින් ද සමලංකෘත බව පැහැදිලි ය.
❖ එම කෘති බොහෝ සෙයින් මිශ්‍ර සිංහල භාෂා ශෛලියෙන් ලියැවී ඇති කෘති වන අතර බොහෝ ඒවා පාලි කෘති මූලාශ්‍රය කොටගෙන ලියැවුණු ඒවාය.

**ස්ත්‍රිය නමැති පුද්ගල ප්‍රපංචය අනපේක්ෂිත අවස්ථා හමුවේ ඊට මුහුණදෙන ආකාරය -**

❖ චුල්ල ධනුද්ධර ජාතිකය -
❖ චුල්ල ධනුද්ධරයන් බිරිඳට දඩමස ඉල්ලාගෙන එන ලෙස කියන අවස්ථාව
❖ ''දඩමස් පුළුස්සා කන මිනිස්සු උන් තෙනට ගොස් දඩමස් ඉල්වා ගෙන එව' යි.'' කියා යැවුහ.
❖ රාජකුමරියකට මහා වනාන්තරයක් මැද දී සොරුන් පිරිසක් අතරට යාමට සිදුවීම.
❖ ස්වාමියාගේ අතින් සොරු ලබාදුන් අමු මාංස ගෙන ඇයට නැවතත් සොරුන් වෙත යාමට සිදුවීම.
❖ සොර දෙටුවා හා චුල්ලධනුද්ධර අතර මහවනමැද සිදුවන සටන ද අනපේක්ෂිත එකකි.
❖ කුමරු සොරා යටකරගෙන කඩුව ඉල්ලන අවස්ථාව
❖ පුද්ගල ඝාතනයක් ඇය අපේක්ෂා නොකළකි.
❖ ඇගේ වික්ෂිප්තිය
❖ සොරාට කඩු මිට හා කුමරුට කඩුව දීමට ක්ෂණයකින් ඈ පෙළඹීම.
❖ කුමරු මරා සොරා සමඟ ගඟ බඩට පැමිණෙන අවස්ථාව
❖ සොරදෙටුවාගේ වචනයට රැවටෙන අවස්ථාව
❖ ''සොඳුර , තොප ඉණ තිබූ ඉණකඩින් තොප පළක් ආභරණ ගලවා බැඳ ලන්න. එතර තබා අවුත් තොප කැඳවාගෙන යෙමි.''
❖ දැඩි විශ්වාසය (වනාන්තරයේ දී හමුවූ සොර දෙටු පිළිබඳ) අදාළ නිදසුන් සමඟින් ගළපා ලිවිය යුතු ය.
චන්ද කින්නර ජාතකය
❖ බරණැස් රජු කිඳුරාට හීයෙන් විදි අවස්ථාව. තම ස්වාමියා හිටි හැටියේ මරණයට පත්වීම අනපේක්ෂිත ය.
❖ ඉන් ඇය ප්‍රකම්පනයට පත්වන ආකාරය ''ඒ ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඬනා ලදුව හඬන්නේ ය.
❖ බරණැස් රජු කින්නරාඞගනාව අස්වසන්නට තමාගේ පාදපරිචාරිකා කොට අග මෙහෙසුන් බවට පත් කරගන්නවා යැයි කියන අවස්ථාව
❖ ''මේ සොරහු විසින් වූ සැටිය. මාගේ ස්වාමි පුරුෂයාණන් විදිනා ලද්දේ යැ'යි බය සෝක දෙකින් වෙවුලමින් දිව ගොස පර්වත මුදුනට නැගී රජහට අවන්ට පටන් ගත්හ.''
❖ තම ස්වාමියා ඔසවාගෙන ගොස් පර්වත මුදුනේ ලා ඔහුගේ හිස තම ඇකයෙහි තබා හඬා වැටෙනා අවස්ථාව (මේ ආදි තවත් පිළිගත හැකි නිදසුන් පිළිතුරු ලෙස භාරගන්න.)

(3). කුසල අකුසල කර්මවල විපාක මතු කරමින් කතා රචනා කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා ප්‍රිය වූ සෙයකි.

**ස්වර්ණතිලකා වස්තුව -**

- ❖ අතීත කතාවේ දී ස්වර්ණතිලකා මලසුන පිරිසිදු නොකොට මල් පූජා කිරීම හා එහිදි එම පිනෙන් තමා රූමත්ව ඉපිදේවායි යන ප්‍රාර්ථනය සඵල වීම.
- ❖ ස්වර්ණතිලකාගේ මව , තම දියණිය මලසුන නොසේදීම පිළිබඳ උරණව චණ්ඩාල කෙල්ල යි යනුවෙන් කියූවිට තම මවට ද එම වදනෙන් බැන වැදීම හේතුවෙන් ඇය චණ්ඩාල කුලයෙහි ඉපදීම.
- ❖ මල් පූජා කිරීම, ප්‍රිය වු සිත්ගන්නා රූප සහිතව ඉපදීමට හේතුවක් වීම
- ❖ ඇය පංචමධුරා පුරයේ රජවරුන්ගේ මන බැඳීමට තරම් ඇය කළ ප්‍රාර්ථනය ප්‍රබල වීම. (තවත් අදාළ කරුණු පිළිතුරු ලෙස භාරගන්න.)

**නන්දි වාණිජ කතා වස්තු -**

- ❖ මෙම කතා වස්තුවේදී ශිව අමාත්‍යයා දැඩි රාගයෙන් උමතුව ක්‍රියා කරන අවස්ථාවේ නන්දිය වෙළඳ බිරිඳ ශරීරයේ අනිත්‍ය ස්වභාවය විස්තර කරයි. කාමයට ගොදුරු වීමෙන් මෙලොව හා පරලොව වශයෙන් ගැහැට විඳීමට සිදුවන ආකාරය වෙළඳ බිරිඳ විසින් පෙන්වා දෙයි. ''එම්බා නැගණියෙණි මේ අනුන්ට අයිති වස්තුව කෙරෙහි වරදවා ක්‍රියා කිරීම තොපගේ අමත්‍යයාට ගුණ නැත. (අපකීර්තියක් සිදුවේ.) මැය තමා තම ස්වම්පුරුෂයා ඉක්මවා යමින් සිටී. මට ද නින්දා වන්නේ ය. මෙසේ ක්‍රියා කරන්නවුන්ට අපායෙනුත් ගැලවීමක් නැත. අන්‍ය පුරුෂයන් හෝ අන්‍ය ස්ත්‍රීන් ඇසුර මෙලොව මෙන්ම පරලොව අනිටු විපාක ලබා දෙන්නක් බව කියයි.''
- ❖ ශිව අමාත්‍යයා නන්දිවාණිජව මන්ත්‍ර හා යක්ෂ ප්‍රේත බලයෙන් මරන්ට යාමේ අවසාන ප්‍රතිඵලය වූයේ තමා ම මරණයට පත්වීමයි. ''මෙසේ අමාත්‍යයා අනුන් මරමි' යයි උපක්‍රම කොට තමා ම මළේ ය.
- ❖ මෙත් වැඩීම තුළින් තමා කරා එන යම් නරක බලවේගයන් වැළැක්විය හැකි බව,
- ❖ කුසල දහම් හි නිරත වීමෙන් , එනම් කුසලයෙන් පුද්ගලයා රක්‍ෂා කරන බව,
- ❖ පින්වත්නි, එසේ නම් ඔබලා අප්‍රමාද ව මෛත්‍රී භාවනාව කරව'' ඔබ සැමට මෛත්‍රීය හා සමාන වූ වෙනත් පිහිටක් නැත'යි කියා...... ශීලයෙහි පිහිටීමෙන් එහි යහපත් ඵලවිපාක ලැබෙන බව''
  (තවත් අදාළ නිදසුන් පිළිතුරු ලෙස සලකන්න.)

**නැතහොත්**

**සිද්ධි අවස්ථා නිරූපණය වාග් චිත්‍ර මැවෙන පරිදි පූජාවලී කතුවරයා දැක් වූ සමත්කම**

**ජීවක වෛද්‍යවරයාගේ කතාව ඇසුරෙන් -**

- ❖ එකල වෛශ්‍යාවන්ගේ ක්‍රියා කලාපය
  '' පුතුන් ලද කල වලදමන්නාහ.....''
  ''දූන් ලද කල නොහඟවා වඩන්නාහ......'' පුත්‍රයෙකු ඉපදුන සැටියේ ඔහු මිහිදන් කරන බව
- ❖ බිම්බිසාර රජු විරී සංචාරයේදී ඇතිවන කතා බහ සංවාදශීලි භාෂාව ඇසුරෙන් නට්‍යානුරූපී අවස්ථා ගොඩනැගීම
  ''තෙලෙ කපුටුවන් කාරුස් බඳනේ කුමන තුණපයකටදැ'යි විචාරා ''
  ''ස්වාමීනී, වලදමාපු බාල දරුකෙනෙකුන්ටය .....'' ''ජීවත් ද අජීවත් දැ'යි
- ❖ කුමරුන් කුඩා කල කෙළි සෙල්ලම් කරනා විට සෙසු මිතුරන්ගේ සමච්චලයට ලක්වීම.
  ''කෙළිමඬලෙහි සෙසු රජ කුමරුවෝ ''මවුන් නැත්තව'යි කිය කියා බැණ බැණ කෙළිණි.''
- ❖ ශිල්ප උගන්ට දිසාපාමොක් ඇඳුරු වෙත යන අවස්ථාව
- ❖ ගුරුතුමා ඉදිරියේ හැසිරෙන ආකාරය
- ❖ ඉක්මණින් ශිල්ප උගෙන නිමවීම
- ❖ ගුරුවරයා එය පරීක්ෂා කරන අවස්ථාව ''සතර වාසලින් සතර දිශාවට සතර යොදුනක් නික්ම ගොස් ඖෂධයට ගත නොහැකි ඵලයක් , පතක් , මුලක් , දණ්ඩක් රැගෙන එව.....''
- ❖ කුමරු සියලු ඖෂධ පිළිබඳ දැනුමෙන් සන්නද්ධ වීම
- ❖ සාකේත නුවර සිටුදේවියගේ හිසේ රුදාව මැඩලන්නට එන අවස්ථාව ''කිරි බොන තරම් බාල දරු කෙනෙකුන් කුමක් කෙරෙත්ද?....''
- ❖ අන්තරසණ්ඨී නමැති රෝගය සොයාගෙන ඊට පිළියම් යෙදීම. (එම අවස්ථාව)
- ❖ භගන්ධරාබාධයෙන් බිම්බිසාර රජු පීඩා විඳිද්දී අන්තඃපුර ස්ත්‍රීන් එය හාස්‍යයට ලක් කරන ආකාරය. ''අපගේ දේවයෙන් උතුනී වූහ. දරු උපතක් සිටිනා සැටිය. නොබෝ කලකින් දරු කෙනෙකුන් වදන සේක. දූ දෝ හෝ පුත් දෝ හෝ.....'' මේ ආදි වශයෙන් තවත් ගැළපෙන නිදසුන් පිළිතුරු ලෙස භාරගන්න.

**(4). සංවාදශීලි බස් වහර -**

හිමි ඔබ ඉදිරියේ
වැයුවත් වෙණ ඉදිරියේ
සිල්ප එක සරියේ
එයින් දුන මැන පඩිසරියේ

ඇඳුරු තුටු නොවෙති
නොසිත අප සිප් නොදනිති
උනුම් වෙණ සදිති
නොදත්තෙමු ගායනා කරති

එබැවින් ඔහු දිනා
දිය දද දියත බඳනා
ලෙසට මහා තෙදිනා
සුදුසු වරයක් දෙවයි යදනා

**වියත් බස් වහර -**

කැර මිණිබරණ රැස්
රැසින් සුර සැව් සුවහස්
සුරන් හා සහසැස්
නොකර සිටියේ අහස් කුස් හිස්

රැගත් සුරා පිරි විතින්
සුරත් තුඹුරු පෙති සෙනෙතින්
පුවත් නොදැන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්

යුදෙහි ඔහු කග ලිය
සමඟ රුපුනද වේව් ලිය
උනඹු සිතුවිලි ලිය
සමඟ ඔහු යස ලිය ද ලිය ලිය

තවත් අදාළ නිදසුන් නිවැරදි පිළිතුරු ලෙස පිළිගන්න.

(5).

**පරිසර වර්ණනා -**

'' හැම වනයක් ම භයානකය , එහෙත් බැද්දේගම අවට තිබූ වනය තරම් භයානක වනයක් නොවීය. වන ගැබින් නැගී සිටි මුඩු කන්දක මුදුනට නැඟුන විට හැම පැත්තෙන් ම සැතපුම් ගණනක් දිගට පැතිර පෙනෙන්නේ මේ වනයම ය.

'' ගම වනයෙන් ම පටන් ගැනී වනයෙන් ම කෙළවර වුයේ ය. වනය ගම වටකරගෙන ගමට ඉහළින් ද වැඩෙමින් ගම තද බද කරගෙන සිටියේ ය.''

'' ඇසල මල් රැනින් මුළු වනයම රන් වන් වූයේ ය. සුදු කරඹ මලින් ද සුදු හා දම් පාට කෙතත් මල් වලින් ද පඳුරු වැසී ගියේ ය.''

පුංචි මැණිකා හා බබුන්ගේ ප්‍රථම හමුවීම -

සංකේතාත්මක යෙදුම් - පුංචි මැණිකාට මුහුණදීමට වන අත්දැකීම් '' ඇගේ ශරීරයේ ලේ අමුතු උද්යෝගයකින් නහර දිගේ දිව්වේ ය. තරුණ ගොනෙකුගේ රාග නිශ්‍රිත කෑ ගෑම වනයේ රැව් දීගෙන ගියේ ය......''

**පුංචි මැණිකා හා බබුන්ගේ ප්‍රථම හමුවීම පරිසර වර්ණනා ඇසුරෙන් සංකේතවත් කරන ආකාරය -**

''රාත්‍රියේ වැසි වැස තිබුණු හෙයින් අවට වනය අලුත් පැහැයෙන් හෙබියේ ය...... මේ වන මඟ යන පුංචි මැණිකාට ඇසුණේ පඳුරක් අසලින් අං ගැටෙන ශබ්දයකි......''

**බැද්දේගම ගම විනාශවන ආකාරය සංකේතවත් ලෙස ගෙන හැර දැක්වීම -**

''මේ ගෙය වනයට විරුද්ධව දිග සටනක යෙදී සිටින සේ පෙණින. මුලින් වැට අද්දර කුඩා ගස් හා පඳුරු සනව වැඩී වැට යට කර ගත්තේ ය......''

'' ...... කුඩා රතු උළු ගොඩ තණ හා මල් පඳුරුවලින් වසා ගත්තේ ය. බිත්තිවල වරිච්චි කෝටු විශාල පඳුරු බවට වැඩුණේ ය......''

වෙදරාළගේ මන්ත්‍ර තමා වෙත බලපෑවේය යි සිළිඳු විශ්වාස කිරීම නිසා අවසිහියට පත්වන ආකාරය.
''අඳුරු වනය පුරා පැතිරෙන්නට පටන් ගනී. තමාට උසුළු විසුළු කරන නොයෙක් ශබ්දයන් කොළ අතු අතරින් ඇසෙන්නට විය......''

'' ...... අවතාරයක් තමා පසු පස එළවාගෙන එන්නාක් මෙන් ද විශාල ශරීරයක් ඇති සතුන් ඔහුට පෙනෙන්නට විය.

තවත් පිළිගත හැකි නිදසුන් පිළිතුරු ලෙස භාරගත හැකිය.

(6). පාසල තුළ දරුවන් අසමානව සැලකීමේ බේදවාචකය

i. කන්ද පාමුල
තවමත් පෙර සේම
එදා තිබූ තැනමය
මගේ පැරණි පාසල

තරඟ වැද
පරයා එකෙකු නොහැරම
ජය කණුව වෙත දිවයන
මඟ කියා දුන් පාසල

පසු පස ම අසුන්වල
අප වෙත සුරත දිගු කොට
බැරි එවුන් යැයි
හෙළා දුටු ඒ දවස......

(අදාළ පිළිතුර සමඟ ගළපා ලියා තිබිය යුතුය.)

ii. උගත් දරුවන් දෙමාපියන් හැර විදෙස් ගත වූ පසු දෙමාපිය සිත කම්පිත වන අයුරු
වෙළාගෙන මා ගත සිත
පාළුව ගලා විත් මා වට කොට
අත් මිදෙනු කෙලසද
මේ රුදු පාළු හැඟුමින්

දුරු රට ගිය මා පුතු
එනතුරු බලා හිඳිනට
හුරු කොට ගත යුතු නොවේද
මා සිත

iii. දරුවන් මෙහෙකාර සේවයේ යෙදවීම

පවුලේ බර අඩු කරන්න ගෙදරින් පිට වන්නට පෙර
මතකද අම්මේ උඹ මට ඇමතුවේ පොඩි දුවේ කියලා
ජීවිතයේ පළමුවරට තනි වුණු කල ඈත රටක
එහි මිනිසුන් හුඟ දෙනෙක් ම මට කිව්වේ ලිසී කියලා

අතින් හිසින් බර උසුලන් පාර දිගේ මං යනකොට
දකින කෙනෙක් මට කිව්වේ ඒ වැඩකිරියක් කියලා
පොඩි දරුවෙකු අතින් අරන් පාසලකට මං යනකොට
එතන හිඳින අය කිව්වේ බේබිගේ ආයම්මා කියලා

(7). කුල මානයෙන් හිස උදුම්මාගත් උද්දාලගේ පරිවර්තනය

පිය සිසුනි සිදු වූයේ
විපතක් ය මට මහත්
නොදැනේය පුවත් කිසි
සිත මාගේ වියවුල්ය

කිරි පැනින් මුව දොවා
ඉවත් කළ හැකි කිලුටු මලකින්
නොවේ මෙවර මලින වූයේ
සිත් සතන් මගේ ශිෂ්‍යයන් ප්‍රිය
මෙවර නම් කිරි පැනින්.....

කුලය, ස්ත්‍රී පුරුෂ ප්‍රේමයට හරස් නොවන බව

මැණික නම් මැණික වේ
කිලුටු පස් යට තිබී ලැබුණු මුත්
මැණික නම් මැණික වේ......

නොවෙමි සම ඔබ බිරිඳ තනතුරට
ඇදුරිදුනි, මම සැඩොල් දුවක් වෙමි
හීන කුලයේ උපන්

**ස්ත්‍රී පුරුෂ ප්‍රේමයෙහි උත්තරීතර බව**

භක්ති ප්‍රේමය , ගෞරවය හෝ
කුමක් කීව ද ඒ එකක් වත්
නොවේ සෙනෙහස
ඈත සිට පිරිහමන භක්තිය
ගෙනත් පාමුල තබන බුහුමන
ඒ එකක්වත් නොවේ සෙනෙහස
දිවා රෑ දෙක හද සමීපේ
දෑස් නොපියා බලා ඉන්නා
දෙයකි සෙනෙහස ......

හදවත් කතරේ මලක් පිපෙන්නට
දිය සීරාවක් සිසිලස දෙන්නට
......................................................

මා නිසා නෙත්මිණි පහන් තුළ
දල්වනුයෙ පෙම් දැල්ල නොනිවා
එකලු කරනුය ම හද මැදුරත
අරක් ගෙන ඇති අඳුර දුරලා

(තවත් අදාළ නිදසුන් පිළිතුරු ලෙස භාර ගන්න. )